

# අඳුන් සිහින

9

හේමමාලා හේරත් ලියන නවකතාව

**මෙතෙක් කතාව**

*රිදීමා, මහීකා, රුචිරා සහ අමා, ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් කරා පැමිණි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවෝය. රිදීමා, තමා දැක පුරුදු තරුණයෙකු නිතර දකී. එහෙත් ඔහු කවුදැයි කීමට තරම් මතකයක් ඇයට නැත. වෛද්‍ය ශිෂ්‍යාවක වන අමා, ඇයව මෝහනය කරනාමුත්, රිදීමාට ඔහු සම්බන්ධ අතීතයක් කරා යාගත නොහැකිවේ. මේ අතර මහීකාගේ පෙම්වතාවන අජයගේ ළඟම මිතුරා දිනූෂගේ සිතෙහිද, රිදීමා ගැන ආදරයක් හටගනී. නිශ්ක නැමැති තරුණයා පිළිබඳව රිදීමාගේ සිතෙහි ඇත්තේ කුමන හැඟීමක්දැයි යහළුවන් සියල්ලන්ටම ඇත්තේ ගැටළුවකි. රිදීමාද මින් පීඩා විඳී. අවසන, රහස කුමක්දැයි සොයා බලා, ඒ විසඳා ගැනීම සඳහා සැවොම කතාවී ලංකාව බලා පියාසර කරති.*

**එතැන් සිට:**

අජය, සුමතිපාලගේ හිසේ සිට පාදාන්තය දක්වා පරීක්ෂාකාරීව තම දෙනෙක් යැවීය. රියදුරකු යැයි පැවසුවත්, ඔහුගෙන් දක්නට ලැබුණේ අහිංසක, බයාදු පෙනුමක් නොව ගැඹුරු, නිහඬ වැදගත් පෙනුමකි. දැන් කාලයේ තරුණයකුටම ඔබිනා ශක්ති සම්පන්න බවක්ද ඔහුගේ දේහයෙන් පිළිඹිබු වූයේය.

දිනූෂද, රිදීමාලේ සොහොයුරු නදීන්ද ආලින්දයේ අසුන්ගෙන සිටියෝය. පළමුදා රාත්‍රියේ, රිදීමා ඇගේ නිවසින් බැස්සවූ ඔවුහු කෙළින්ම, දිනූෂලාගේ නිවසට පැමිණියෝය. සුමතිපාල උදෑසනින් ම මෙහි පැමිණ තිබුණේ, අප්පුහාමි කලින්ම යැවූ පණිවිඩයකට අනුවය. ඔහු සෘජු ලෙස ඔවුන් ඉදිරියෙහි සිටගෙන උන්නේය.

අජයට සිතුණේ ඔහු මහා ආඩම්බරකාරයකු බවකි. නදීන් අය්යා නම් ඒ ගණන්ගත්බවක් නොපෙනුණේය. දිනූෂ සිටියේ පුරුදුපරිදි සිහින ලොවක සැරිසරමිනි. රිදීමාද එහි කරක් ගසනවා ඇතැයි සිතූ අජයගේ කට කොණකට සිනාවක් නැගුණේය.

"සුමති දන්නවද අපේ ගමේ හිටපු නැටුම් මාස්ටර්ව ?" ඇසුවේ, නදීන් අය්යාය. කොහෙ-ාමත් බැරෑරුම් පෙනුමක් වූ ඔහුගේ මුහුණින් පළවූයේ, අතිශය භාරදූර කටයුත්තකට තමා අත ගැසුවාක් වැනි සැකමුසු, කරදරකාරී බැල්මකි.

සුමතිපාල මඳක් කල්පනා කළේය.

"එක්කෝ ඔව්, නැත්නම් නෑ..... ඔයතරම් කල්පනා කරන්නේ මොනවද ?" අජය සිතින් තමාටම කියා ගත්තේය. අප්පුහාමි බයාදු සිනා-වක් පාමින් කතා කළේය.

"උන්නැහැ සුමතිගේ කුඩප්පච්චි කෙනෙක් වෙච්චි....."

එවර නම් දිනූෂද හිස එසවූයේය.

"එහෙමද ?" ඒ නදීන් අය්යාය.

"දැන් එයාලා කොහෙද පදිංචි ?"
"හොයලා බලන්නම් සර්...."

සුමති පිළිතුරු දුන්නේ මදක් කල්පනා කරලාය.

"ඇයි එයාලා යන තැනක කියලා ගියේ නැද්ද ?" අජය ඇසීය. සුමති ඔහු දෙස බැලුවේ නැත.
"මේකේ මොකක් හරි හොරයක් තියෙනවා...." අජය කල්පනා කළේය.

"ඔයාගේ කුඩප්පච්චි කෙනෙක් කීවානේ. ළඟ නෑකමක්ද දුර නෑකමක්ද මම දන්නේ නැහැ. පවුල් දෙකේ අමනාපයක් නැත්නම් යනතැනක කියලා යයි නේද ?"

එවරනම් සුමති, අජය දෙස එක එල්ලේ බැලීය. ඒ දෑසේ ක්‍රෝධයක් ඇතිව, නැතිවී යනු අජයට පෙනිණි.

"එයාලයි, අපියි අතර සම්බන්ධයක් නැහැ සර්. කාලෙකට ඉහතදි උණු සිද්ධියක් හන්දා අපි දෙගොල්ලො වැඩි ආශ්‍රයක් නෑ...."

සුමති සිහින් සරින්, නදින් අමතා පැවසීය.

"එයාලා ගමෙන් ගියේ නැහැ. යන තැනට වැඩේ සිද්ධ කරගත්තා..."
අප්පුහාමි මිදුලට බැස බුලත් කෙළ පාහරක් ගැසීය. ඔහුගේ ගෙල මුල වූ කොණ්ඩා ගැටය දිස්වූයේ, කුඩා කරුංකා ගෙඩියක් වැනිවය.

"ඒකට හේතුව ?" දිනූෂ විමසීය.
"ඒක දිග කතාවක් සර් !"

"මම හිතන්නේ අපි හැමෝටම ඕනතරම් වෙලා තියනවා දිගකතා අහගන ඉන්න...." අජය උළුවස්සට හේත්තු වූයේය.

"මෙච්චර දුරක් අපි අවෙත් ඔය දිග අහගන්නමය තමයි !" සියල්ලෝම මුවින් නොබැන මද වේලාවක් උන්නෝය.

"උදේට කිරිබත් හදලා මාළු හොද්දකුයි, කට්ට සම්බෝලකුයි හැදුවා මහත්තැන්ලට. නෝනලා ටික නම් තාම නිදි මයෙ හිතේ....."

අප්පුහාමි නිහඬතාවය බින්දේය. සුමති සුසුමක් හෙලීය.

"සර්ලා කෑම කාලා එනකල් මම මෙහෙන් ඉන්නම්....."

මිතුරෝ එකිනෙකා දෙස බැලූහ.

"මොකද කියන්නේ ?" දිනූෂ, අජයගෙන් ඇසීය.

"මම කියන්නද ? ඔක්කොම කෑම මේසෙට යමු. සුමතිටත් පිඟානක් තියන්න අප්පුහාමි. අපි කෑම කන ගමන් කතා කරමු....."

අජය අප්පුහාමිට පැවසුවේය.

"නෝනලට මහන්සි ඇති. කැමති තරමක් නිදාගත්තාවේ !"

සුමති මේසෙට වාඩි වූයේ, කැමැත්තෙන් නොවේ.

"මම කුස්සිය පැත්තට ගිහින් කාලා එන්නම් සර්...." ඔහු කිහිපවතාවක්ම දිනූෂට කීවේය.

පිඟානට කිරිබත් කැබලි කිහිපයක් බෙදාගත් අජය,

"දැන් කියමුකො බලන්න...." විධානය කළේය.
"නැටුම් සර් මගේ කුඩප්පච්චි කෙනෙක් වෙච්චි. ඒත් අපි ළඟ ආශ්‍රයක් තිබුණෙ නෑ සර්... මගේ අප්පච්චි නිකම්ම නිකං බෙරවායෙක් විතරයි. මමත් ඉගෙන ගත්තු එකක් නෑ. ඒත් ඒ පවුලෙ පුතෙක් හිටියා හොඳට ඉගෙන ගත්තු...."

දිනූෂ හිස එසවූයේය.

"කෝ එයා දැන් ?"
"මං දන්නේ නෑ සර්..."
"සුමති කතාව කියන්න..." අජය මාලු කෑල්ලක් පිඟානට දමාගත්තේය. මොනවා නැතත් අප්පුහාමි මාළු හොද්දට හොඳින් මිරිස් දමා තිබුණේය.

"ඒ පුතයි, ඉස්කෝලේ ලොකු මහත්තයගේ දුවයි අතර පොඩි සම්බන්ධයක් තිබිලා තියනවා..."

සුමති හොරැහින් නදින් අය්යා දෙස බලනු අජය දුටුවේය.

"එතනදි ලොකු පටලැවිල්ලක් වෙලා තමයි එයාලා ගමෙන් ගියේ..."

සුමතිගේ මුහුණ දිස්වූයේ ගලෙන් නෙලුවාක් මෙන් හැඟීම් විරහිතවය.

අප්පුහාමි තේ කෝප්ප සහිත බන්දේසියක් කෑම මේසය වෙත ගෙනාවේය.

"ලොකු මහත්තයාගේ දුවක් ගගේ ගිහින් මළාද සුමතියෝ !"

නදින් තිගැස්සුණේය. අප්පුහාමි දෙස බැලූ සුමතිගේ දෑසෙහි වූයේ ක්‍රෝධයකි.

